**26-08-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඥාන සාගරය වන පියා, ඥාන වැස්සෙන් මෙම පොළොව හරිතවත් කිරීමට නැවත පැමිණ ඇත. දෙව්ලොව දැන් ඉදිවෙමින් පවතියි. එහි යාමට නම් දිව්‍ය ප්‍රජාවට අයත් විය යුතුව ඇත.

**ප්‍රශ්නය:** උසස්ම ගණයට උසස් වූ ඔබ දරුවන්ගේ යුතුකම ව ඇත්තේ කුමක් ද?

**පිළිතුර:** ඔබේ නියත යුතුකම වන්නේ උසස් ආධ්‍යාත්මික සේවය කිරීමයි. උසස් ම බ්‍රහ්මිණ්වරුන්ගේ යුතුකම වන්නේ මෙහි සිටින ගමනුත් යන එන ගමනුත් ශ්‍රීමත් පිළිපැදීම මගින් පියාට සහය දී විශේෂිත ලෙස භාරතයත් සාමාන්‍යයෙන් මුළු ලෝකයත් පාරිශුද්ධියට පත් කිරීමයි.

**ගීතය:** ස්නේහවන්තයා සමඟ සිටිනා සැමට ඥාන වැස්ස වසී.

ඕම් ශාන්ති. ඥාන සාගරය වන්නේ ආධ්‍යාත්මික පියාය. ශිව බාබා ය. ඒ නිසා ආධ්‍යාත්මික පියා ඔහු සමඟ සිටින ආධ්‍යාත්මික දරුවන්ට ශිව බාබා කෙබඳු පියෙක් දැයි විස්තර කර දෙයි. බ්‍රහ්ම බාබාට ඥාන සාගරය යැයි නො යෙදේ. උත්තරීතර පියා, උත්තරීතර අශරීරික කෙනා යනුවෙන් හඳුන්වන්නේ ශිව බාබා ය. එක්කෙනෙක් භෞතික පියා වන අතර අනෙක් කෙනා මේ ලොව අභිබැවූ ආධ්‍යාත්මික පියාය. එක්කෙනෙක් ශරීරයේ පියා වන අතර අනෙක් කෙනා අශරීරික අයගේ පියාය. මේ කරුණු ඉතා හොඳින් අවබෝධ කර ගත යුතු ව ඇත. ඔහු වූ කලී ඥානය කියාදෙන ඥාන සාගරයයි. හැම කෙනෙකුටම සිටිනනේ එකම එක පරම සත්‍යය වූ දෙවියන් වන අතර මේ ඥානය දිය හැක්කේ ඔහුට පමණි. කොහොමනමුත්, මිනිසුන් ආගමික ලේඛණ වලින් කියවන දේත් කරන භක්ති ක්‍රියාත් ඥානය නොවේ. ඒවා මගින් ඥානය නොලැබේ. ඒවා නිසාමයි භාරතය මේ තරම් වියළි තත්ත්වයට පත් වී ඇත්තේ. දුප්පත් කමේ පහර ඊට වැදී ඇත. වැසි නැති කළ සම්පූර්ණ භූමිය වියළී යයි. භක්ති මාර්ගය එවැනිය. එය ඥාන මාර්ගය නොවේ. දෙව්ලොව ස්ථාපනය වන්නේ ඥානය මගිනි. එහි භූමිය පවා හරිත වර්ණය, කිසිවිට වියළී නො යයි. මෙම අධ්‍යයනය එම ඥානය සම්බන්ධවය. පරම සත්‍යය වන පියා හෙවත් දෙවියන් ඔබව දිව්‍යමය ප්‍රජාව බවට හරවයි. පියා ඔබට කියා ඇත්තේ ඔහු සියලු අශරීරික අයගේ පියා කියාය. කොහොමනමුත්, මා හෝ මගේ ක්‍රියා පිළිබඳ නොදැනුවත්කම නිසා මනුෂ්‍යයා අපිරිසිඳු හා අසතුටින් යුත් අනාථයින් බවට පත් වී ඇත. ඔවුන් එකිනෙකා අතර සටන් කරයි. පවුලක පියා නැති කළ දරුවන් දබර කර ගනී. ඔවුන් අතර සැමවිට ගැටුම් පවතී. එවිට අන් අය උඹලාට පියෙක් නැත්දැයි අසයි. මෙකල ලෝකයේ කිසිවෙක් පියා නම් වූ මුල නොදනී. එසේ මුල නොදැනීම නිසා මේ තරම්ම දුක්ඛිත තත්ත්වයට පත්වී ඇත! ඔහු සිහි වීමෙන් ගැලවීම ලැබේ. සියලු දෙනාට ගැලවීම ලබා දෙන්නේ ඒ කෙනා පමණි. ඔහුට බාබා යැයි කියයි. ඔහුගේ නම හැම විට ම ශිවා නම් වේ. එය කිසිවිට වෙනස් නොවේ. මිනිසුන් ගේ දොර අත්හැරි විට, නම් වෙනස් කරයි. ගෑණු ළමයෙක් විවාහ වූ කළ නම වෙනස් වේ. එය භාරතයේ ක්‍රමයයි. වෙනත් රට වල මෙය එතරම් තදින් නැත. මේ ශිව බාබා සැමගේ ම මව ද පියා ද වේ. මවත් ඔබයි පියාත් ඔබයි යනුවෙන් ගී ගැයේ. භාරතයේ පමණි හඬගා කියනුයේ ඔබේ අනුකම්පාව නිසා අපට ප්‍රීතිය ලැබේ කියා. නමුත් භක්ති මාර්ගයේ දී පියාගෙන් අනුකම්පාවක් නො ලැබේ. භක්ති මාර්ගයේ දී එවන් සතුටක් ලැබෙන්නේ ද නැත. දෙව්ලොව යනු සැපෙන් පිරි තැනක් බව ඔබ දනී. එය වූ කලී නව ලෝකයයි. වියපත් ලෝකයේ ඇත්තේ ම දුකයි. ඉතා හොඳින් ජීව මරණයට පත් වූ අයට තමන්ගේ නම හොඳින් වෙනස් කරගත හැක. නමුත් ඔවුන් මායාගෙන් බැටකා ශුද්‍ර වන නිසා බාබා නම් වෙනස් කිරීම නවතා දැමීය. ඒ නිසා බ්‍රහ්මිණ් මාලාවක් තැනිය නොහැක. ඔබ අයත් වන්නේ ඉහළම ඉහළ කොට්ඨාශයටය. ඔබ ඉතා ඉහළ අධ්‍යාත්මික සේවය කරන අයයි. මෙහි සිටියත් යන එන අතරත් ඔබ භාරතයට විශේෂිතවත් මුළු ලොවට සාමාන්‍යයෙනුත් සේවය කරයි. ඔබ ලෝකය පාරිශුද්ධියට පත් කරයි. ඔබ පියාගේ සහායකයින්ය. ඔබ සහය වන්නේ පියාගේ උසස් උපදෙස් වූ ශ්‍රීමත් පිළිපැදීමෙනි. මේ භාරතය පමණි පිරිසිඳු දේශය වන්නේ. හැම චක්‍රයේ ම අපි මෙම භාරතය පිරිසිඳු කර එහි පාලකයෝ වෙමුයි අපි කියමු. බ්‍රහ්මිණ්වරුන්ගේ සිට අනාගත දෙවි දේවතාවුන් බවට අප පත් වේ. විවිධ ස්වරූප ප්‍රතිමා ඇත. ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් බ්‍රහ්මිණ්වරු වේ. ප්‍රජාපිතා බ්‍රහ්මා ඉදිරියේ පමණයි ඔවුන්ට බ්‍රහ්මිණ් විය හැක්කේ. ඔබ දැන් පෞද්ගලිකවම ඔහු ඉදිරියේ සිටියි. ඔබ එකිනෙකා ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් ලෙස සැලකේ. ක්‍රමය එයයි. ඔහුගේ දරුවන් ලෙස ඔබ සහෝදර සහෝදරියන් බවට පත් වේ. සහෝදර සහෝදරියන් අතර අපරාධකාරී

බැල්ම කිසිවිට නැත. බාබා මෙම අනඥාව පනවයි ඔබ උපත් 63 ක් අපිරිසිඳු ව සිටියා. අසීමිත පියා ඔබට අඩගැසුවේ ඒ නිසයි. අශරීරික අය කතා කරනුයේ ශරීර මගිනි. ශිව බාබා මෙසේ කියයි මා ද කතා කරනුයේ මෙම ශරීරයෙනි. මා වෙන කෙසේ කරම් ද? මගේ උපත දිව්‍යමය වේ. සත් යුගයේ දී දිව්‍යමය ගුණාංග ඇති දෙවි දේවතාවන් සිටී. වත්මන් කාලයේ දී ඇත්තේ යක්ෂ ගුණාංග ඇති මිනිසුන් ය. කොහොම අය වුවත් මෙහි මිනිසුන්ට දෙවිදේවතාවුන් යැයි කිව නොහැක. ඔවුන් ලොකු නම් දා ගනියි. සාධු වරු ඔවුන්ට ශ්‍රී ශ්‍රී යැයි දා ගන්නා අතර අනිත් මිනිසුන්ට තනි ශ්‍රී යනුවෙන් යොදයි. ඔවුන් පිරිසිඳු යැයි ශ්‍රී ශ්‍රී යැයි දා ගත්තා වුවද ඔවුන් මනුෂ්‍යයින්ය. ඔවුන් පාපයේ නොයෙදුනත් ඔවුන් ජීවත් වන්නේ පාපකාරී ලෝකය තුළය. අනාගතයේ දී ඔබ පාපයෙන් තොර දේවි දේවතාවුන් ලෙස ලෝකය පාලනය කරයි. එහිද ඇත්තේ මිනිසුන් වුවද ඔවුන්ට දිව්‍ය ගුණාංග ඇත. මෙකල, මිනිසුන් අපිරිසිඳු වන අතර යක්ෂ ගුණාංග ඇත. ගුරුනාණක් දෙවියන් අපිරිසිඳු කැත ඇඳුම් සේදූ වගක් කියයි. ගුරුණානක් ද පියාව පැසසුමට ලක් කරයි. එම පියා දැන් විනාශයෙන් පසු ස්ථාපනය ක්‍රියාත්මක කිරීමට පැමිණ ඇත. ආගම් කර්තෘවරුන් ඔවුනගේ ආගම සඳහා ම වෙන් වේ. අනෙක් ආගම් නැති නොකරයි. අන්‍ය ආගම් ද පැතිරී යයි. පියා දැන් එම පැතිරී ම නවතයි. ඔහු එකම එක ආගම ස්ථාපනය කරන අතර අනෙක් විවිධ වූ සියලු ආගම් නැති කර දමයි. නාටකය අනුව මෙය සිදුවිය යුතුමය. පියා මෙසේ කියයි මා ආදී සනාතන දේවි දේවතා ධර්මයට උරදෙමි. ඒ සඳහා මා කරනුයේ ඉගැන්වීමයි. සත් යුගයේදි අනේක විධ ආගම් සියල්ල නො තිබේ. එම සියලු අශරීරික අය නැවත ගෙදර යාමට නාටකය අනුව නියමිතය. එම විනාශය කිසිවෙකුට නැවැත්විය නො හැක. එසේ වූ කල පමණි මේ ලෝකයේ සාමය ඇති විය හැක්කේ. යුද්ධයෙන් පසු දෙව්ලොවට දොර විවෘත වේ. ඔබට මෙසේ ද ලිවිය හැක මේ මහාභාරත යුද්ධය මින් පෙර චක්‍රයේ ද සිදු විය. ප්‍රදර්ශනයක් කරන විට මෙසේ ලියා තැබිය යුතුයි දෙව්ලොව ඇරඹීමට පියා උත්තරීතර දනව්වේ සිට පැමිණ ඇත. පියා මෙසේ කියයි දෙව්ලොව හදන දෙවියා වන පියා දෙව්ලොව සෑදීමට පැමිණේ. කොහොමනමුත්, දෙව්ලොව වාසීන් බවට ඔබ දරුවන් පත් කිරීමට මම ඔබේ ම සහය පතමි. මේ අශරීරක අය පිරිසිඳු කරන්නේ කවුද? එවැනි බොහෝ අය ඇත හැම ගෙදරකටම මෙය විස්තර කර දෙන්න භාරතයේ ඔබ සතෝප්‍රධාන් ව සිටියා. උපත් 84 ක් ගැනීමෙන් ඔබ තමෝප්‍රධාන් වුණා. දැන් නැවතත් සතෝප්‍රධාන් වන්න, මන්මනභාව්! ආගමික ලේඛන විශ්වාස නොකරනවා යැයි නොකියන්න අපි භක්ති මාර්ගයත් ආගමික පොතුත් විශ්වාස කළා. නමුත් දැන් භක්ති අන්ධකාරය අවසාන වෙමින් ඇත. දහවල උදා වන්නේ ඥාණයෙනි. ගැලවීම ලබා දීමට පියා පැමිණ ඇත. අන් අයට තේරුම් කර දීමට ඔබට සූර ක්‍රම අවශ්‍යය. සමහරු මෙය හොඳින් දන්නා අතර අන් අය සුළු වශයෙන් දනී. හොඳ ළමුන්ට ප්‍රදර්ශන වලදී හොඳින් විස්තර කරදිය හැක. පියා ගුරුතුමා වන්නා සේම ළමුන් ද ගුරුවරු විය යුතුයි. ''සත්ගුරු ඔබව ගොඩ දමයි'' යනුවෙන් කියයි. සත්‍යයේ දේශය හදන සැබෑ බාබා වන්නේ පියාය. මිත්‍යාවේ දේශය හදන්නේ රාවණ් ය. අපට දැන් ගැලවිම ලබා දෙන්නා හමුවී ඇති නිසා භක්තිය කළ යුතු ද? භක්තිය යනු අනෙක් ගුරු නමින් හඳුන්වන්නාගේ ඉගැන්වීම් ය. සත්ගුරු වන්නේ එකම එක කෙනාය. සත්ගුරු යනු අමරණීය කෙනා යැයි කියැවේ. එසේ වී තිබිය දීත් බොහෝ අය ගුරු වෙන්නට තතනති. විවිධ ආකාරයේ ගුරුවරු සහ සන්‍යාසීන් ඇත. සික් භක්තිකයෝ අමරණීය සත්ගුරු ගැන කියති. ඉන් අදහස් වන්නේ මරණය අත්දැකීම නොලබන කෙනාය. මනුෂ්‍යයෝ මරණය අත්විඳිති. පියා මෙසේ කියයි මන්මනභාව්! සික් වරු මෙසේ කියයි ස්වාමියාගේ නම ගායනා කළොත් සතුට ලැබේ. පද දෙකක් ඇත. ස්වාමි වූ මා සිහි කරන්න. එකම ස්වාමි කෙනෙක් ඇත. ගුරුනාණක් ද කීවේ ඒ ගැනය. ඇත්තෙන්ම ඔබ කිසිවක් ගායනා කළ යුතු නැත. සිහිපත් කිරීම පමණක් කරන්න. එය කිය හැකි මන්ත්‍රයක් නොවේ. ශිවා ශිවා යැයි කිව යුතු දෙයක් නොවේ. ඔබ නිහඬ දේශයට යා යුතුයි. දැන් පියා සිහි කරන්න. ඔබට උගන්වන පියා ගැන මැතිරිය නොහැක. මිනිසුන් සණ්ඨාර ගසමින් බොහෝ සද්ධ ඇති කරයි. ගායනා කරන ගීත වල තේරුම වත් නොදනී. සතුට ලබා දෙන්නේ පියාය. ඔහුට ව්‍යාස් යැයි ද කියයි. ඔහුට ඇති ඥානය ප්‍රදානය කරයි. සතුට ද ලබා දෙයි. ඔබ දරුවන් දැන් උසස් තත්ත්වයට පත් විය යුතුයි. ඉණිමග පිංතූරයේ මේවා පැහැදිලි ලෙස දක්වා ඇත. මෙකළ දී කිසිම කලාවක් ඉතිරි වී නැත. ''මා ගුණවතෙක් නොවේ, මට වටිනාකමක් ද නැත'' නිර්ගුණ් බාලක් නමින් සංවිධානයක් ද ඇත. කුඩා ළමුන් මහත්මා වරු සේය. ඔවුන් තුළ වැරදි නැත. ඒ නිසා නිර්ගුණ් බාලක් නම් දෙන ලදී. දරුවන් ගුණවත් නැත්තේ පියා ගුණවත් නැති නිසාය. සියලු දෙනා වරද සහිතය. දෙව් වරු පමණි ගුණයෙන් යුක්ත. පළවෙනි වරද පියා ගැන නොදන්නා කමයි. දෙවෙනි වරද වූ කළී විෂ සාගරයේ ක්‍රීඩා කිරීමයි. පියා මෙසේ කියයි ඔබ කල්ප භාගයක් ම මෙසේ සිටියා. දැන් ඥාන සාගරය වන මම ඔබ කිරි සයුර වෙත ගෙන යමි. මා දෙන ඉගැන්වීම් වලින් එසේ වෙයි. මා අශරීරික ඔබ ළගම සිටිමි. මා නිදහස් නිසා මට ඕනෑම වෙලාවක ආ ගිය හැකියි. ඔබ මිය ගිය කෙනෙකුට කෑම දෙන විට දෙන්නේ එම ආධ්‍යාත්මයටය. ශරීරය විනාශ වී ඇත. එය

එවිට නැත. ඔබ සලකන්නේ අශරීරික කෙනාට ආහාර දුන් ලෙසය. එවිට එය පැමිණෙයි. එය ද නාටකයේ කොටසකි. ඇතැම් විට පැමිණේ ඇතැම් විට නොපැමිණේ. මෙහිදී ද එසේ පැමිණෙන මුත් උපන් තැන නොකියයි. ඔහු කියන්නේ සතුටින් හොඳ ගෙදරක ඉන්නවා කියා පමණි. ඥානය ලබා ගත් අයට හොඳ ගෙවල් ලැබේ. කෙසේ නමුත්, සතුට තිබිය හැකිය. රජ කෙනෙක් වීම වැඩකාරයෙක් වෙනවාට වඩා හොඳයි නේද? රජ කෙනෙක් වීම සඳහා මෙම ඉගෙනීම කරන්න. මෙම ලෝකය කිලිටු වේ. මෙහි ආශ්‍රය අපිරිසිඳුය. බාබාගේ ආශ්‍රය පමණි ඔබ ගොඩ දමන්නේ. අන් අය ඔබව ගිල්වා දමයි. පියා සියල්ලන්ගේ කේන්ද්‍රය දනී. මෙය පවිත් පිරි ලෝකයක් නිසා අප මේ ලෝකයෙන් යා යුතු යැයි මිනිසුන් කියයි. පියා මෙසේ කියයි ඉමිහිරි දරුවනි, මගේ භාරයට පැමිණ මගේ උපදෙස් පිළිපදින්න. මේ ලෝකය දූෂිතය. දහස් ගණනින් වංචා ඇත. පියා ඔබ දෙව්ලොව හිමිකරුවන් බවට පත් කරයි. ඒ නිසා ඔබට අනන්ත වූ සතුටක් තිබිය යුතුය. ඇත්තෙන්ම මෙයයි සත්‍ය ගීතාව. පසුකලෙක මේ ඥානය අතුරුදන් විය. දැන් ඔබට ඥානය ඇතත් ඊළඟ උපතේ දී එය නැති විය හැක. ඒ නමුත් එකලට මෙහි ප්‍රතිඵලය ලැබෙනු ඇත. පියා ඔබට උගන්වන්නේ ඉහළම තත්ත්වයට පත් වීමටය. දැන් ඔබ පියා දනී. අමරනාථ වන්දනාවේ යන අයගෙන් මෙසේ අසන්න. සූක්ෂම ලෝකයේ සිටිය යුතු අය මෙහි ශාරීරිකව සිටින්නේ කෙසේ ද? මෙහි කඳු ආදිය නම් ඇත. අපිරිසිඳු කෙනෙක් සූක්ෂම ලෝකයේ සිට පාර්වතීට ඥානය දෙන්නේ කෙසේ ද? ඔවුන් අයිස් වලින් ලිංගමය සාදයි. එය ඕනෑම තැනක සැදිය හැක. මිනිසුන් ඒ තරම්ම මුලාවට පත්ව ඇත. පාර්වතී පිරිසිඳු කළ යුතු වන්නේ කෙසේ දැයි ඔවුන් නොදනී. ශංකර් යනු දෙවියන් නොවේ. දේවතාවෙක් පමණයි. මිනිසුන්ට මේවා විස්තර කළාට තේරෙන්නේ නැත. ඔවුන්ට දිව්‍යමය බුද්ධියක් නැත. බොහෝ මිනිසුන් ප්‍රදර්ශන කරා එති. මෙය ඉතා හොඳයි. කවුරුත් මෙය ලැබිය යුතුයි. ඔවුන්ට මෙසේ කියන්න. පළමුව ඔබ ඥානය ලබා ගන්න! එවිට ඔවුන්, කාලය නැති බව කියයි. ප්‍රදර්ශන වලදී මෙසේ ලියා තබන්න යුද්ධයට පෙර පියා දෙව්ලොව සාදයි. දෙව් ලොව ගේට්ටු විවෘත වෙන්නේ විනාශයෙන් පමණයි. හැම පිංතූරයකම මෙසේ ලියන්න පාරලෞකික උත්තරීතර පියා, උත්තරීතර අශරීරික කෙනා වූ ත්‍රි මූර්ති ශිව දෙවියන් කතා කරයි. ඔබ ත්‍රි මූර්ති යැයි නොලිව්වොත් ඔවුන් මෙසේ කියයි ඔවුන් දැනුම දෙන්නේ කෙසේ දැයි අසයි. එවිට මෙසේ විස්තර කරන්න මොහු ක්‍රිෂ්ණාව සිට දැන් අශෝභන මනුෂ්‍යයෙක් වී ඇත. ඔබ සැම දැන් මනුෂ්‍ය බවින් දෙවි දේවතා බවට පත් ව සිටී. ඉන්පසු ඉතිහාසය නැවත සිදුවේ. මනුෂ්‍යයින් දෙවි දේවතාවුන් කරවීමට දෙවියන්ට දිගු කාලයක් නොයයි. ඉන්පසු ඔවුන් ඉණිමගේ පහළට පැමිණෙමින් මනුෂ්‍යයින් බවට පත් වේ. එවිට පියා පැමිණ නැවත දෙවි දේවතාවුන් බවට පත් කරවයි. පියා මෙසේ කියයි දැන් මා පැමිණ ඇත. සෑම චක්‍රයකම සංගම් යුගයේ දී මා පැමිණෙයි. රාවණ් ඔබව පාපී අය කරවයි. වියපත් ලෝකය අළුත් කරවන්නේ පියාය. මේවා අවබෝධ කරගත යුතු කරුණුය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. පියා සේම ගුරුවරයෙක් වන්න. සෑම කෙනෙක් ම මේ මිත්‍යාවක් වූ ලෝකයෙන් දක්ෂ ලෙස මුදවා ගෙන සත්‍යයේ දේශයට සුදුසු අයවළුන් කරවන්න.
2. ලෝකයේ ආශ්‍රය නරක ආශ්‍රයකි. ඒ නිසා ඉන් ඈත්ව සත්‍යයම වන ඒකායන කෙනා ඇසුරේ සිටින්න. උසස් භාවය ලැබීමට මෙය අධ්‍යයනයේ යෙදෙන්න. එකම පියාගේ උපදෙස් පිළිපදින්න.

**වරදානය:** ඔබ සතුව ඇති සියල්ල අදෘෂ්‍යමාන දානී කෙනෙකු සහ පුණ්‍ය ආත්මයක් ලෙස සේවය සඳහා පූජා කෙරෙත්වා.

ඔබ කරන ඕනෑම සේවාවක්, ලෝක යහපත සඳහා දිගටම පූජා කරන්න. භක්ති මාර්ගයේ, අප්‍රකට පුණ්‍ය ආත්මයන් සිතන්නේ ඔවුන්, සියල්ල සැමගේ යහපත සඳහා පරිත්‍යාග කළ යුතු බවයි. එලෙසම, ඔබ සතුව ඇති සෑම සිතිවිල්ලක්ම සේවය සඳහා පූජා කළ යුතුයි. ඔබ වෙනුවෙන්ම යමක් කර ගැනීමට කිසි විටෙකත් ආශාවක් ඇති කර නොගන්න. සෑම කෙනෙකුටම සේවය කරන්න. බාධාවක් වන ඕනෑම සේවාවක් සැබෑ සේවයක් යැයි නොකියයි. එබැවින්, ඔබ වෙනුවෙන්ම සියල්ල කර ගැනීම අතහැර, සැබෑ අදෘෂ්‍යමාන දානී කෙනෙකු ලෙස සේවය කර ලෝකයට යහපත සැළසීම දිගටම කරගෙන යන්න.

**පාඨය:** සියල්ල පරමාත්ම දෙවියන්ට භාර දෙන්න, එවිට ඔබට ඕනෑම දුෂ්කරතාවක් පහසු වන බව අත්විඳිය හැකිය.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: සහජ යෝගීවරයෙක් වීම සඳහා, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහසේ අත්දැකීම් ලබන්න.**

දවස ආරම්භයේදී, අම්රිත් වේලාවේ පටන්, පරමාත්ම දෙවියන්ගේ සෙනෙහස ඔබේ හදවතින් සම්පූර්ණයෙන්ම උරා ගන්න. ඔබේ හදවත දෙවියන්ගේ සෙනෙහසින්, දෙවියන්ගේ බල වලින් සහ දෙවියන්ගේ දැනුමෙන් පිරී ඇති විට, ඔබේ බන්ධනය සහ සෙනෙහස වෙනත් කිසිවෙකු වෙත නොයනු ඇත. ඔබට පරමාත්ම පියා කෙරෙහි සැබෑ සෙනෙහසක් ඇති විට, සැබෑ සෙනහසේ සලකුණ වන්නේ සමාන වීම සහ කර්මතීත් වීමයි. ''කරවන්හාර්'' (සියල්ල සිදු කරවන තැනැත්තා) වෙමින් සියල්ල කරන අතර අන් අයටත් එසේ කිරීමට සලස්වන්න. ඔබේ මනස, බුද්ධිය හෝ සංස්කාර වල බලපෑම යටතේ කිසි විටෙකත් කිසිවක් නොකරන්න.